## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

# ලංසු සඳහා ආරාධනයයි

## කාර්යාල ගොඩනැගිලි (බදු පදනම මත) ලබා ගැනීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 විසින් **අනුරාධපුරය, මහනුවර, මාතර, යාපනය සහ මඩකලපුව** යන දිස්ත්‍රික්කවල කාර්යාල පහසුකම් ස්ථාපිත කිරීමට වසරක කාලසීමාවක් සඳහා බදු පදනම මත කාර්යාල ගොඩනැගිලි ලබා ගැනීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

සපුරාලිය යුතු මූලික අවශ්‍යතා පහත පරිදි වේ :

- අයදුම්පත දේපළෙහි හිමිකරු විසින් ඉදිරිපත් කළ යුතුය.
- දේපළ සඳහා නිරවුල් ඔප්පු තිබිය යුතුය.
- ලංසු ලේඛනයේ දක්වා ඇති අවශ්‍යතා සම්පූර්ණයෙන්ම සපුරාලිය යුතුය.
- බදු කාලසීමාව වසරකි.
- ප්‍රධාන පාරට මුහුණලා, මහා නගර සභා සීමාව තුළ පිහිටා තිබිය යුතුය.
- වර්ග අඩි 700 ක පමණ බිම් ප්‍රමාණයකින් යුත් තනි මහල් ගොඩනැගිල්ලක් හෝ බහු මහල් ගොඩනැගිල්ලක බිම් මහල විය යුතුය.
- අවම වශයෙන් වාහන 05 ක් සඳහා වාහන නැවැත්වීමේ පහසුකම් තිබිය යුතුය.
- ගොඩනැගිල්ලේ වයස අවුරුදු 15 ට අඩු විය යුතුය.
- එක් එක් දිස්ත්‍රික්කය සඳහා වෙන වෙනම ලංසු ඉදිරිපත් කළ යුතුය.

ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක්, මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට අධ්‍යක්ෂ (පාලන සහ ආයතනික කටයුතු), ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර, 2026.02.24 සිට 2026.03.13 දක්වා පෙ.ව. 9.00 සහ ප.ව. 3.00 අතර කාලය තුළ රුපියල් පන්දහසක (රු. 5,000) ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවා

**හෝ**

2026.03.17 දිනට අවම වශයෙන් වැඩ කරන දින 3 කට පෙර බැංකු ගෙවීම් පත්‍රිකාවේ පිටපතක් සමඟ ada.admin@trc.gov.lk වෙත අයදුම්පතක් එවීමෙන් ලබා ගත හැක. ගෙවීම් සිදු කිරීමේ ක්‍රමය වන්නේ මුදලින් හෝ අන්තර්ජාල ප්‍රේෂණයක්/බැංකු ගෙවීමක් 119-1001-4-3693169, මහජන බැංකුව නාරාහේන්පිට මගිනි.

නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන, මුල් පිටපත සහ අනු පිටපත ලෙස වෙනම කවරවල බහා "මුල්පිටපත" සහ "අනුපිටපත" ලෙස සලකුණු කර, එම කවර දෙකම තනි මුද්‍රා තැබූ කවරයක බහා ඉදිරිපත් කළ යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ "............... දිස්ත්‍රික්කයේ කාර්යාල ඉඩ පහසුකම් බදුපදනම මත ලබා දීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

ලංසුව, ගොඩනැගිල්ලේ හිමිකරු හෝ හිමිකරුගේ බලයලත් නියෝජිතයෙකු විසින් ලංසු ලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍ර භාවිතා කර ඉදිරිපත් කළ හැකිය. බලයලත් නියෝජිතයෙකු ලංසුව සමඟ බලය පැවරීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුය.

සියලුම ලංසු සමඟ රුපියල් විසිදහසක (රු.20,000.00) "ලංසු සුරැකුමක්" (Bid-Security) ඉදිරිපත් කළ යුතුය. මෙය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද මෙරට ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් ලබාගත් හෝ මුදල් තැන්පතුවක් ලෙස ඉදිරිපත් කළ යුතුය. මෙම ලංසු සුරැකුම ලංසු ලේඛනයේ දක්වා ඇති ආකෘතියට අනුව විය යුතු අතර, එය 2026.05.16 දක්වා වලංගු විය යුතුය.

ලංසු පහත ලියාපදිංචි ලිපිනයට තැපෑලෙන් එවිය යුතු අතර, නොඑසේනම් කොළඹ 08, ඇල්විටිගල මාවත, අංක 276 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට 2026.03.17 දින ප.ව. 2.00 ට පෙර බහාලිය යුතුය.

ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා : සහකාර අධ්‍යක්ෂ (පාලන) - 011-2669789

**අධ්‍යක්ෂ / පාලන සහ ආයතනික කටයුතු**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**අංක 276, ඇල්විටිගල මාවත**
**කොළඹ 08.**
2026.02.22

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා විදුලිසංදේශ නියාමන කොමිෂන් සභාව,**
**අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08.**